# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

## METH SAVIYA NEWSLETTER


• සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව • 2005 ජූලි • මෙත්සවිය දෙවන කාණ්ඩය • හය වන කලාපය






නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා !
ගතින් මෙත් සිතින් රෝ මුදම් වා !
බැතින් තුන් රුවන් ඔප් නගම් වා !
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා !

**අප ගැන වචනයක් ....**

මෙත් සවිය සංසදය නිරවුල් මනසක් ඇති වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි. ඒ ඒ සෙත්‍රයන්ට අදාල විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මෙමගින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තොරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත / ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත්වන අන්දම, කාල කළමනාකරණය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩ සටහන් වැනි ඒ ඒ කාලවලදී පවත්වන වැඩ සටහන් සඳහා සහභාගිවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයින්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක් දාන - ශීල - භාවනා වැඩ සටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරන විධායක කමිටු හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි. වර්තමාන සාමාජික සංඛ්‍යාව දහසක් පමණ වන අතර මී ළඟ චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන පැවත්වීම හා නව සාමාජිකයින් බඳවාගැනීම සඳහා සාමාජික අයදුම් පත් නිකුත් කිරීම 2005 අගෝස්තු මාසයේදී සිදුකෙරේ.

## සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු







### අපගේ භාවනා වැඩසටහන් සඳහා තැනෙන රහතුන් වැඩසිටි පිළිකුත්තුව භාවනා මධ්‍යස්ථානය

රහතන්වහන්සේලා වැඩසිටි ගල්ලෙන් 99 ක් පමණ ඇතැයි සැලකෙන ඉපැරණි පිළිකුත්තුව රජ මහා විහාරය අක්කර 48ක වපසරියකින් යුතුය. අවට ඇති ගල්ලෙන් තුල දින 2-3 භාවනා වැඩසටහන් පැවැත්වීමට අප සැලසුම් කර ඇත. සංගමයේ සාමාජික එස්. ජී. පියරත්න මහාතාගේ මගපෙන්වීමෙන් අනුයුක්තවූ මෙම භාවනා මධ්‍යස්ථානය ක්‍රි. පූ. 3 වැනි සියවසේ දෙවන පෑතිස් රජ දවස ආරම්භ විය. මෙම විහාරයට වළගම්බා රජුගේ දායකත්වය ද ලැබී ඇති බව ඉතිහාසයේ කියැවේ. මෙහි ජනප්‍රවාද කිහිපයකි. කැලණිතිස්ස රජුගේ මයිලණුවන්ගේ සිවුරු සැඟවූ හෙයින් මෙම ස්ථානය "පිළිකුත්තුව" වූ බව ද, වළගම්බා රජු ඇතුළු සේනාවට රෙදි සාදන ලද ගම වූ බැවින් ඩඩපිළිකුත්තුවඩඩ වූවා යැයි ද ජනප්‍රවාදයේ සඳහන් වේ. මෙම වෙහෙර බිමට අයත්, නුවර යුගයට අයත් සිතුවම්, ආවාසගෙය, සෙල් ලිපි, ලී පාලම සහ ගල් ලෙන් 99 ක් සහිත භූමි ප්‍රදේශය ඉපැරණි ඉතිහාසයක සාධක මනාව පිළිබිඹු කරයි.

ගමන් මග : කොළඹ නුවර මාර්ගයේ මිරිස් වත්ත හංදියෙන් වතුරගම මාර්ගයේ කි. මී. 5 ක් පමණ පැමිණ එතැනින් පිළිකුත්තුව හංදියෙන් කි. මී. 1 ක් පමණ ඉදිරියට යා යුතුය.

**ගමන් මර්ගය**



ඓතිහාසික පිළිකුත්තුව රජමහා විහාරය



### මීළඟ දාන-සීල-භාවනා වැඩසටහන 2005.08.07

අප සංගමයේ මීළඟ දන- සීල- භාවනා වැඩසටහන හා රැස්වීම 2005 අගෝස්තු 07 වන ඉරු දින ගම්පහ - පිළිකුත්තුව රජ මහා විහාරයේ දී පැවැත්වේ. එදින වැඩසටහනට සහභාගී වීමට එන සියළුම සමාජිකයින් සිල් සමාදන් වීට සුදුසු ඇඳුමින් පැමිණෙන්නේ නම් මැනවි. එදින පැමිනෙන විට හිල් දානය සඳහා පළතුරු රැගෙන එන්න.

දවල් දානය වනුයේ පළතුරු පමණක් වන අතර දහවල් දානය සාමජිකා හේමලතා මැණිකේ ඇතුලු පවුලේ සැම විසින් වසර 6 කට පෙර මිය ගිය සිය ස්වාමිපුරුෂයාට හා ඊට පෙර මියගිය මව්පියන් ඇතුලු මියගිය සියළු ඥාතීන්ට පින් අනුමෝදන් කරනු පිණිස පරිනමනු ලබයි.

මෙහි රහතුන් වැඩ සිටි ගල්ලෙන් තුල වාඩිවී භාවනා කිරීමට සුදුසු පරිදි අසුන් , බිම එලාගැනීමට පත් ඉරු හෝ ඉටිරෙදි, පානය සඳහා ජලය මදුරුවන්ගෙන් හිරි හැර පැමිණියොත් ඉන් බේරීමට අවුටාන්, මොස්පැන් හෝ පැගිරිතෙල් ස්වල්පයක් වැනි දෑ රැගෙන එන්න.

මෙහි ඇති සංඝයා වහන්සේලා ප්‍රමාණය 1-3 පමණි. පිරිකර කැමති අයට රැගෙන ආ හැක.

මේ සඳහා සහභාගී වන මෙත්සවිය සාමාජිකයින් හා ඔවුන්ගේ පවුල්වල අය මෙත්සවිය කාර්යාලයට ප්‍රවාහන ගාස්තු සඳහා යන බරපැන පියවී මට රු. 150 පමණ මුදලත් සුදානම් කරගත යුතුය. බස් වල ඉදගෙන යාමට ආසන වෙන්කර ගැනීමට අවශ්‍ය අය මෙත්සවිය කාර්යාලයට දුරකථන ඇමතුමත් දී එය සිදු කරන්න. මගදී (නුවර පාර) බස්රථ වලට ගොඩවීමට බලාරොත්තු වන අය (0714-014467) සම ලේකම් තුසිත දොඹගොඩ මහතා (0777-710765) හෝ සමලේකම් බී. ඩබ්ලිව් චමින්ද මහතා (0773-065807) හෝ වෙත දුරකථන අමතුමක් දී එය සිදු කරන්න.

බස්රථ පිටත් වීම කොළඹ - 07 බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්ම ගවේශි බෞද්ධ ආශ්‍රමයෙන් 2005.08.07 ඉරු දින පෙ. ව. 7.45 ටය. නැවත කොළඹට පැමිණීම ප.ව. 4.30 ටය. (පිළිකුත්තුවෙන් පිටත් වීම ප. ව. 3.30 ය.) තම වාහන වලින් කෙළින්ම පැමිණෙන අය පෙ.ව. 9.00 වන විට පිළිකුත්තුව රජමහා විහාරයට පැමිණෙන්න.

## අසරණ සරණ සේවා අනුකම්ටුව ආරම්භකිරීම

මෙත්සවිය අසරණ සරණ සේවා අනු කම්ටුවට බැදී වැඩකටයුතු කිරීමට කැමති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අය තම නම ලිපිනය හා දු.ක. අංකය ලිපියක් මගින් කාර්යාලයට බාරදෙන්න. දුකට පත් සාමාජිකයන්හට හා ඔවුන්ගේ පවුල්වල අයටත් දුකට පත් සාමාජික නොවන සාමාජිකයන්ගේ අසල් වැසියනටත්, තෙවනුව සියළුම ලෝ වැසියනටත් උදව් උපකාර කිරීම මෙහි අරමුණයි. මේ පිළිබඳ උනන්දුවක් දක්වන අයගේ මුලික රැසවීමක් පිළිකුත්තුවේදී සවස 3.00ට පැමිණ පැවැත්වීමට බලාපොරොත්තු වෙමු. අසරණ සරණ සේවා අනුකම්ටුවේ සභාපති ඇතුලු නිලධාරි මඩුල්ල තේරාගැනීමද එදින සිදුවේ.

## තෙවන හා හතරවන කණ්ඩායම්වල සාමාජිකත්වය අළුත් කරගැනීම

මෙතෙක් සාමාජිකත්වය වාර්ෂිකව අළුත්කර නොගත් අය 2005.08.31 වන විට සාමාජිකත්වය අළුත්කර ගත යුතුය. කාර්යාලයට පැමිණිය නොහැකි අය හට ගෙවන කාර්යාල, වැල්ලවත්ත යැයි සටහන් කළ මෙත් සවිය නමින් ලියු රු. 500/-ක් වටිනා මුදල් අණවුමක් හෝ "මෙත්සවිය" හෝ ඉංග්‍රීසි භාෂාවෙන් "Methsaviya" නමට ලියන ලද රේඛනය කරන ලද චෙක්පතක්, ලිපිනය ලියු රු. 20.00ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් හා පරණ සාමාජික කාඩ්පතද සමග ලියාපදිංචි තැපැලෙන් ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයාරාමය, පෙඩ්රිකා පාර, කොළඹ- 6 යන ලිපිනයට 2005.08.31 දිනට පෙර එවිය යුතුය.

## පාලාස්ටික් හැදුනුම්පත

තිබ්රිගස්යාය නිව් ජෙනරල් ෆෝටෝ මගින් පලාස්ටික් හැදුන්පත් නිකුත් කිරීම සඳහා ජායාරූප ලබාගත්තද එම යන්නට අබලන් වීම නිසා හැදුණුම් පත් නිකුත් කිරීම දිනෙන් දින පසු කරයි. පාලාස්ටික් හැදුන්පත් පහසු මිලට නිකුත්කල හැකි ජායාරූපකරණට අදාල රැකියාවන් කරන සාමාජික භවතුන් වත්කම් මෙම කර්තව්‍ය භාර දිය හැක. කරුණාකර කාර්යාලය අමතන්න. හැළුනුම් පත් සඳහා 6 වන කණ්ඩායමේ සමාජකයින්ගේ ජායාරූප ගැනීම 2005.08.14 ඉරු දින කොළඹ ධර්ම ගවේශි බෞද්ධ අශ්‍රමයේදී ප. ව. 12.30 සිට 2.00 දක්වා සිදු කෙරේ. උඩුකය සුදු ඇඳුමක් ඇඳ පැමිණෙන්න.

## සංසදයේ අනුශාසකත්වය

අප මෙත්සවිය සංසදයේ සාමාජිකත්වය ලබාදෙන ලෙස පසුගිය බණවාරයේදී ඉල්ලාසිටි ගරු හාරිස්පත්තුවේ ආර්යවංශාලකාර ස්වාමීන්ද්‍රයන් වහන්සේත් භාවනා කම්මට්ඨානාචාර්ය ගරු මඩවල උපාලි ස්වාමීන්ද්‍රයාණන් වහන්සේත් සංසදයේ අනුශාසනවරුන් ලෙස පත්කිරීම පිළිබඳව නුදුරේදී කටයුතු කරනු ඇත.

## මරණයට කැප වූ සතුන් නිදහස කිරීමේ වැඩසටහන

මරණය කැපවු සතුන් නිදහස් කිරීම හා අසරණ සරණ සඳහා එක්කල මුදල් තබා ගැනීමට අපහසු අයට එම මුදල් කාර්යාලයට භාරදිය හැක. සතුන් නිදහස් කිරීම ඉදිරි මාසය තුල සිදුකිරීමට බලාපොරොත්තු වෙමු.

## සංසඳයේ දීපව්‍යාප්ත ශාඛා පිහිටුවීම

බොහෝ දෙනෙකු විසින් සංසදයේ ශාඛා තම ප්‍රදේශවල පිහිටවන ලෙස ඉල්ලා එවා ඇත. මේ සඳහා මුලිකත්වය ගෙන ප්‍රදේශිය සභාපති හා ලේකම් හා නිලධාරිවරු ලෙස කම්ටු කිරීමට කැමති අය ඒ පිළිබඳව ලිඛිතව කාර්යාලයට දැනුම් දෙන්න.

ඉදිරි භාවනා වැඩ සටහන් වලින් එකක් කොළඹ දී නොපවත්වා මහනුවර දී පැවැත්වීමට එම පෙදෙසේ ස්වාමින් වහන්සේලා විසින් කරන ලද නොයෙකුත් ඉල්ලීම් මෙසේ ශාඛා සංවිධාන පිහිටුවීමට හේතුවී ඇත. මේ අතර හම්බන්තොටද මෙවැනිම භාවනා මධ්‍යස්ථානයක් තැනීමට පිරිසක් ඉදිරිපත්ව ඇත. ඒ සඳහා ඔවුන් ඉඩමක්ද වෙන් කර ඇත. එහෙත් මෙතෙක් ඒ පිළිබඳ තිරණයකට එලඹ නැත.

## සංසඳයේ සැප්තැම්බර් - ඔක්තෝම්බර් වැඩ සටහන්

2005.09.04 - ප්‍රථම ඉරුදින මාසික වැඩසටහන හා රැස්වීම කොළඹ - 07 ධර්ම ගවේශි බෞද්ධ ආශ්‍රමයේදී ප.ව. 2.00 සිට 4.00 දක්වා පැවැත්වේ. එදින දේශනය කැලණිය විශ්වවිද්‍යාලයේ බෞද්ධ අංශයේ මහාචාර්ය සුමනපාල ගල්මන්ගොඩ මහතා විසින් හෝ මෙතේ බුදු සසුන පිළිබඳ අනාගත වංශය මැයෙන් ආචාර්ය චන්ද්‍රන ජයරත්න මහතා විසින් හෝ පවත්වනු ලැබේ.

2005.10.02 - ප්‍රථම ඉරුදින මාසික වැඩසටහන හා රැස්වීම කොළඹ - 07 ධර්ම ගවේශි බෞද්ධ ආශ්‍රමයේදී ප.ව. 2.00 සිට 4.00 දක්වා පැවැත්වේ. එදින භාවනාව පිළිබඳ විශේෂ දේශනාව ස්වර්ණවාහිනියෙන් ඔබ හමුවට නිතර පැමිණෙන භාවනා කම්මට්ඨානාචාර්ය ගරු මඩවල උපාලි ස්වාමිද්‍රයන් වහන්සේ විසිනි. අප සංසදයේ අනුශාසකත්වය දැරීමට උන්වහන්සේද කැමැත්ත ප්‍රකාශ කර ඇත.


අපගේ මීළග ත්‍රෛයි මාසික දාන-සිල-භාවනා වැඩසටහන නොවැම්බර් 06 ඉරු දින දිවා ගුහාවේදී හෝ ඉසිගිලි කන්දේදී පැවැත්වීමට කටයුතු සැළසුම් කරමින් පවති.

**ඉහත වැඩසටහන් පිළිබඳව නැවත ලිපි මගින් දැනුම්දෙනු නොලැබේ. කරුණාකර අදාළ දිනයට පැමිණෙන්න.**

# බුද්ධෝත්පාදෝ දුර්ලභං

බුදුබව ලැබීම සඳහා නියත විවරණ ලබන බෝධිසත්වවරු එම අත්මයේ දී මෙම සුදුසුකම් ද ලබා තිබිය යුතුය.

1. මිනිසත් බව
2. පුරුෂාත්මය
3. රහත්වීමට හේතු සම්පත් ඇති බව
4. බුදු කෙනෙකුන්ගේ දර්ශනය
5. ප්‍රව්‍රජ්‍යාවක පිහිටීම
6. ධ්‍යානලාභී බව
7. ජීවිත පරිත්‍යාගය ආදී පරිත්‍යාගයන් කිරීම
8. බුද්ධත්වයක් ලබා ගැනීම පිණිස බලවත් කැමැත්තක් ඇති බව යන මේ කරුණු අටයි.



අනතුරුව ජාත්‍යන්ධ, ජාති බඳිරාදි අටලොස් අභව්‍ය කාරණයන්ගෙන් වෙන්ව, ඡන්ද, චිත්ත, විරිය, විමංසා යන ගුණයන්ගේ දැඩිව පිහිටිය යුතුය. එසේම දස පාරමී ධර්මයෝ, පාරමී, උපපාරමී, පරමත්ථ පාරමී, වශයෙන් සම තිස් ආකාරයෙන් වැඩිය යුතුය. මේ ආදී ගුණ ධර්මයන් දීර්ඝ කාලයක් ඔස්සේ වැඩිය යුතු හෙයින් බුදු කෙනෙකුගේ පහළවීම ඉතාමත් දුර්ලභ වෙයි.

## අපිත් කරමු ප්‍රාර්ථනා...
## බුදු සසුනේ තනතුරු ලත් උපාසකවරු

1. ප්‍රථම බුදුන් දහම් සරණ ගිය ද්වේවාචික උපසකවරු - තපස්සු භල්ලුක වෙළෙඳ දෙබෑයන්
2. අග්‍රදායක පදවිය - අනේපිඬු හෙවත් සුදත්ත සිටුවරයා
3. ධර්ම කථිකයින් අතර අග්‍රස්ථානය - චිත්ත ගෘහපතියා
4. සතර සංග්‍රහ වස්තු ආදියෙන් රටවැසියාට සංග්‍රහ කළවුන් අතර අග්‍රස්ථානය - හත්තාලවක රජු
5. අග්‍ර ප්‍රනීත දායකයින් අතර අග්‍රස්ථානය - මහානාම ශාක්‍ය රජු
6. රිසි දෑ දෙන්නවුන් අතර අග්‍රස්ථානය - උග්ග ගෘහපතියා
7. අචල ශ්‍රද්ධා ඇත්තවුන් අතර අග්‍රස්ථානය - සුරම්බට්ඨය
8. පෞද්ගලික ප්‍රසාද ඇත්තන් අතර අග්‍රස්ථානය - ජීවක කොමාරභච්ච
9. සංඝෝපස්ථායකයන් අතර අග්‍රස්ථානය - උග්ගත ගෘහපතියා
10. විස්වාස කතා ඇත්තවුන් අතර අග්‍රස්ථානය - නකුල පිතු ගෘහපතියා

## බුදු සසුනේ තනතුරු ලත් උපාසිකාවෝ

1. ප්‍රථම බුදුන් සරණ ගිය උපාසිකාව - සුජාතාවන්ය
2. අග්‍රදායිකාවන් අතර අග්‍රස්ථානය ලැබුවේ - විශාකාවන්ය.
3. ප්‍රනීත දෑ දෙන දායිකාවන් අතර අග්‍රස්ථානය ලැබුවේ - සුප්පවාසාවයි
4. ධ්‍යානීන් අතර අග්‍රස්ථානය ලැබුවේ -උත්තරාවන්ය
5. බහුශ්‍රැතතාවීන් අතර අග්‍රස්ථානය - ඛුජ්ජුත්තරාවයි
6. නොසෙල්වෙන සැදැහැවතියන් අතර අග්‍රස්ථාන - කාතියානි
7. විශ්වාස කතා ඇත්තිවුන් අතර අග්‍රස්ථානය - සාමාවති
8. මෛත්‍රී විහාර ඇත්තියන් අතර අග්‍රස්ථානය - සාමාවති
9. ආරංචියෙන් බුදු ගුණ අසා පැහැදුණු අය අතරින් අග්‍රස්ථානය - කාලි
10. ගිලානෝපස්ථානයිකාවන් අතරින් අග්‍රස්ථානය - සුප්පියා ද ලැබිය.

ආර්.ඒ.ඩී. ඉදුමර ගුණසේකර - යගිරල
පළමු කණ්ඩායම සා.අංක 360

# Kamma - Vipaka

**Classification of Kamma as it Produces Fruit**

*1. Dittha Dhamma Vedaniya Kamma*
Immediately effective Kamma

*2. Upapajja Vedaniya Kamma*
Subsequently effective Kamma

*3. Aparapariya Vedaniya Kamma*
Indefinitely effective Kamma

*4. Ahosi Kamma*
Lapsed Kamma which becomes inoperative

*5. Janaka Kamma*
Generarive Kamma which conditions future birth

*6. Upapidaka Kamma*
Supportive Kamma

*7. Upatthambaka Kamma*
Counteractive Kamma

*8. Upaghataka Kamma*
Destructive Kamma

*9. Garuka Kamma*
Weighty or serious Kamma

*10. Asanna Kamma*
Death proximate Kamma

*11. Accina Kamma*
Habitual Kamma

*12. Katattavapana Kamma*
Cumulative Kamma which lies dormant and becomes active in the presence of other supporting Kammas

**- Dr. Chandana Jayaratne**

## කියා දුනි මෙත් සවිය

අකරුණාවන්ත ලොව සසල කරවිය — මසිත
දයා දිය පොදක්වත් නොලැබ ගල් වුනිය — සිත
අමාවක උදා වී තිබුණ මගෙ දිවිය — වෙත
පුන් සඳක් වුනි නිබඳ සිත නිවන සවිය — මෙත

ඇලීමත් ගැටීමත් නිසා දුක උපදී — ලු
දුකින් තොර වෙන්න නම් පාරමී පුරන්න — ලු
රිදුනු සිත නිවන්නට මෙත් සිතම වඩන්න — ලු
නිවන් දොර ඇරගන්න නිබඳ වෙර දරන්න — ලු

වම් අතින් දරා සිටි අතීතයෙ බර පොදි — ය
දකුණතින් දරා ඇති අනාගත බර පොදි — ය
ඔවුන් සිත් වඩන්නට ලබා සැනසිලි සුව — ය
බිම තැබිය යුතුම බව කියා දුනි මෙත් සවි — ය

අසා දැන තිබුණි මුණි දෙසු දහම මින් පෙරත්
බුද්ධියට නොවැටහුනි නිවාගන්නට මසි — ත්
පසක්වුනි ජීවිතේ නිසරු බව යළි යළි — ත්
හඩා වැලපෙනු කුමට සුවය ගැන මා නොල — ත්

වසරක්ම ගතවීය නොකියාම නොදැනී — ම
මෙත් සවිය දුන් සවිය සිත නිවා ඇත බෝ — ම
උපේක්ෂා සිතින් නිති දකින්නට ලෝ දහ — ම
මගේ සිත සවිමත්ය සැමකල්හි සැම දා — ම

සාමාජිකා අංක 102

# සියළු බෝසතාණන් වහන්සේලාට පොදු වූ ධර්මතාවයෝ....

# බෝසත් උපතක අසිරිය

බුදුරජාණන් වහන්සේ නමක් මෙලොව පහළ වන්නේ ඉතාමත්ම කලාතුරකිනි. ලෝක සතුන් මේ දීර්ඝ වූ සංසාරය පුරා සුගතියෙන් දුගතියටත් දුගතියෙන් සුගතියටත් යන ආකාරය දකින්නේත් එම සංසාර ගමන වලක්වන ආකාරය පිළිබඳව දකින්නේත් බුදුකෙනෙකුම පමණි. මෙලෙසින් දුර්ලභව පහළවන බුදුන්වහන්සේලා චතුරාර්යය සත්‍යය ධර්මය දේශනා කොට නුවණැති දෙව්මිනිස් ප්‍රජාව අමානිවනට පමුණුවන සේක. (බුද්ධ ගුණය)

මෙලෙස පහළවන සෑම බුදුවරයකුගේම උපත සිදුවන විට ඒ හා බැඳී පවතින බුදුරජාණන්-වහන්සේලාටම පමණක් සීමාවූ අසිරිමත් සාධාරණ වූ සුවිශේෂ කාරණාවක් පිළිබඳව අප අමාමෑණී බුදුපියාණන් වහන්සේ දීඝ නිකායේ මහාපදාන සූත්‍රයේදී පෙන්වා වදාළ සේක. එය මෙසේය.

* සෑම බෝසතාණන් වහන්සේ කෙනෙක්ම තුසිත දිව්‍යලෝකයෙන් චුතව මනා සිහිනුවණකින් යුතුව මිනිස් මව් කුස තුළ පිළිසිඳ ගනිති.

* බෝසතනාණන් වහන්සේ මව් කුස තුළ පිළිසිඳ ගන්නා අවස්ථාවේදී දස දහසක් ලෝක ධාතුවම මහත් වූ ආලෝකයක් පැතිරයයි. එම ආලෝකයෙන් ලෝකාන්තරික නිරය පවා (ඝන අන්ධකාරයෙන් යුතු නිරයකි) ආලෝකමත්වෙයි. එවිට එහි ඇති තිරිසතුන් තමා මෙන්ම වෙනත් සතුන්ද මෙහි දුක්විඳින බව දැන ගනී.

* බෝසතානන් වහන්සේ මව් කුස තුළ වැඩෙන විට බෝසත් මවව මනුෂ්‍යයින්ගෙන් හෝ අමනුෂ්‍යයින් ගෙන් අනතුරක් නොවන ආකාරයට සතරවරම් දෙවිවරු විසින් ආරක්ෂා කරයි.

* බෝසතාණන් වහන්සේ මව්කුස තුළ පිළිසිඳ ගැනීමෙන්පසුව බෝසත් මව උතුම් පඤ්ච සීලයෙන් යුතු ප්‍රකෘතියෙන්ම සිල්වත් තැනැත්තියක් බවට පත්වෙන අතරම පිළිසිඳ ගත් මොහොතේ සිට ඇය විරාගී සිතිවිලි ඇති තැනැත්තියක් බවට නිතැතින්ම පත්වේ. එබැවින් කිසිම පුරුෂයෙකුට රාගී සිතින් ඒ කාලය තුළ ඇයව ඇසුරු කළ නොහැක.

* බෝසතාණන්වහන්සේ මව් කුස තුළ පිළිසිඳගත් දින සිටම බෝසත් මවට ප්‍රියමනාප රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, සිතිවිලි ලැබේ. මේ ආකාරයට ඇයට ප්‍රියමනාප දේවල් පමණක් ලැබෙන අතරම කිසිදු රෝග පීඩාවක් නොවැළඳේ. එපමණක් නොව තම කුසේ සිටින දරුවා රන් පළසක තැබූ මැණිකක් ලෙසින් ඇයට දැකිය හැකිය.

* බෝසතාණන් වහන්සේ මිනිස් මව්කුසින් ඉපදී හරියටම දින 7 කින් මව කළුරිය කරන අතර සියලුම මව්වරුන් තුසිත දිව්‍යලෝකයේ උපදිති.

* බෝසත් මව්වරුන් දරුවා බිහිකරන්නේ හරියටම මාස 10 ක් පෝෂණය කිරීමෙන් අනතුරුව වන අතරම ඇය දරුවාව බිහි කරන්නේ සිටගෙන සිටින ඉරියව්වෙන් සිටය. (සාමාන්‍ය කාන්තාවන් දරුවන් බිහිකරන්නේ ඉඳගෙන හෝ නිදාගෙන සිටින ඉරියව්වෙනි.)

* බෝසතාණන්වහන්සේ මව්කුසින් බිහිවන විට පළමුවෙන් බෝසත් පුතුව දෙවියන් විසින් පිළිගනී. මිනිසුන් අතට ලැබෙන්නේ ඉන්පසුවයි. එමෙන්ම බිහිවන අවස්ථාවේදීම සතරවරම් දෙවිවරු විසින් දරුවා අතට ගෙන දෙවියනි. සන්තෝෂයට පත්වනු මැනව. මහේශාක්‍ය වූ පුත් කුමාරයෙක් උපන්නා යැයි පවසති.

* බෝසතාණන් වහන්සේ මව් කුසින් ලෝකයට බිහිවන්නේ ඉතාමත් පිරිසිදුව වන අතරම මව් කුසින් උපදින විට අහසින් ඇල්දිය හා උණුදිය දහරා දෙකක් මතුවී බෝසත් මව හා පුතුව දියෙන් පිරිසිදුවේ.

* බෝසත්පුතු ඉපදුනු පසු උතුරු දිශාව බලා පියවර 7 ක් ගමන් කොට මෙම ගාථාව කියයි.

අග්ගෝ හමස්මි ලෝකස්ස- සෙට්ඨෝ හමස්මි ලෝකස්ස - ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස - - අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෝ

(මම ලොවට අග්‍රවෙමි. මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි. මම ලොව ජ්‍යෙෂ්ඨ වෙමි. මේ මාගේ අන්තිම ඉපදීමයි නැවත ඉපදීමක් නැත.)

* බෝසත් පුතු ඉපදීමෙන් පසු දසදහසක් ලෝක ධාතුවම මහත් වූ ආලෝකයක් පෙර සේම පැතිර යයි. පෙර සේම ලෝකාන්තරිත නිරය පවා ආලෝකමත් වේ.

මෙලෙස සියලු බෝසතාණන් වහන්සේලාට පමණක් සීමාවූ ධර්මතාවයන්වේ.

("මේ ගෞතම බුද්ධ රාජ්‍යයයි" නම් සඟරාවෙහි ගලිගමුවේ ඤාණදීප ස්වාමීන් වහන්සේගේ ලිපියක් ඇසුරින් තොරතුරු ලබාගන්නා ලදී.)

ජේ.වී.එම්. ප්‍රියදර්ශනී - ගම්පහ
සා.අංක 959

---

## දන්දීම ගැන

මහණෙනි, දීමෙහි හා බෙදී මෙහි අනුසස් මම දන්නා තරම් අනෙක් අයත් දන්නවා නම් ඒ කිසිවෙක් ටිකක් හරි අනුන්ට නොදී නම් අනුභව කරන්නේ නැහැ. ලෝභකමට ඉන්නේ නැහැ. තමන් කන බත් පිඩෙන් කොටසක් හෝ පිළිගන්නට කෙනෙක් සිටිනවා නම් ඉන් කොටසක් හෝ නොදී අනුභව කරන්නේ නැහැග

**ඉතිවුත්තක පාලි - ඒකක නිපාතය**

## ලෝභකම

මහණෙනි, මගේ කීමට එක දෙයක් අත්හරින්න. එය අත් හැරියොත් නුඹලා අනාගාමී වන බවට මම පොරොන්දු වෙමි. ඇපවෙමි. ඒ එකම දෙය නම් ලෝභ කමයි.

*ඒක ධම්මං භික්ඛවේ පජහථ අහං වෝ පාටිභෝගො අනාගමිතාය.*
*කතමං ඒකධම්මං, ලෝභං භික්ඛවේ ඒක ධම්මං*

**ඉතිවුත්තක පාලි - ඒකක නිපාතය**

ජයන්ත ලොකුලියන - සා.අංකය 569

# මිනිසාට ඇත්තේ ශාඛ භක්ෂක සතුන්ගේ ක්‍රියාදාමයයි එම නිසා සත්ව මාංශ කෑම මිනිසාට අහිතකරය

## ශාක භක්ෂක

1. ශරීරයේ දිග මෙන් හය ගුණයක් හෝ දහ ගුණයක් පමණ බඩවැල් දිගය. (ආහාර බොහෝ වෙලා දිරවන දිගු බඩවැල් ඇත.)
2. ආමාශය දිගටි මල්ලක හැටය ගනී.
3. ඛාදිය සමෙන් පිටවෙයි
4. කෙලවල ටයලින් රසායනය ඇත.
5. වතුර පානය කරන්නේ තොල් වලිනි.
6. කොළ, ගෙඩි කඩා ගැනීමට අත් සකස් වී ඇත.
7. අඹරා කන දත් ඇත. තියුණු නිය, උල්දත් නැත.
8. උනන කිරි වෙනත් සතුන්ට බිමට හොඳය.
9. යටි හක්ක දෙපැත්තට සෙලවිය හැක.
10. හයිඩ්‍රො ක්ලෝරික් අම්ලය ඇත්තේ ස්වල්පයකි.
11. අධික විෂ සහිත යූරික් අම්ලය ඉවත් කිරීමේ හැකියාව ඇත.
12. යූරියා බිඳ දමන යූරිසෙස් එන්සයිමය නැත.
13. සත්ව මාංස කෑමට සිතත්, කයත් පිළියෙල වී නැත.
14. ඇස් සූර්යාලෝකයට සහ වෙනත් ආලෝකයන්ට ඔරොත්තු දේ
15. ඉපදුන විට ඇස් ඇරීමට පුළුවනි.
16. එකවිල්ලේ බොහෝ දුර දුවයි.
17. නිද්‍රාව අඩුයි.
18. අලස නැත. බර අදී.
19. දිව මෘදුය.
20. ආහාර ගැනීමේදී සන්සුන්ය.
21. හිලෑ කිරීමට පහසුය.
22. තම දරුවන්ට ආදරේය

## මාංශ භක්ෂක

1. ශරීරයේ දිග මෙන් දෙගුණයක් හෝ තුන් ගුණයක් පමණ බඩවැල් දිගය. (කෙටි බඩවැල් ඇත)
2. ආමාශය රවුම් මල්ලක් මෙනි.
3. ඛාදිය සමෙන් පිට නොවේ
4. කෙලවල ඇත්තේ අම්ලයයි.
5. වතුර පානය කරන්නේ දිවෙනි.
6. මාංස බඩවැල් ඉරා කෑමට අත්, නිය සකස් වී ඇත.
7. තියුණු නිය හා දිග මුවහත් උල් දත් ඇත.
8. උනන කිරි ස්වල්පයක් වේ. වෙනත් සතුන්ට බිමට හොඳ නැත.
9. යටි හක්ක සෙලවිය හැක්කේ ඉහළට පහළට පමණි.
10. හයිඩ්‍රො ක්ලෝරික් අම්ලය බහුලව ඇත.
11. අධික විෂ සහිත යූරික් අම්ලය ඉවත් කිරීමේ හැකියාව හොඳින් ඇත. (බඩවැල් කෙටිනිසා)
12. යූරියා බිඳ දමන යූරිසෙස් එන්සයිමය ඇත.
13. සත්ව මාංස කෑමට සිතත්, කයත් පිළියෙල වී ඇත.
14. ඇස් සූර්යාලෝකයටත් අනෙක් ආලෝකයන්ටත් ඔරොත්තු නොදේ.
15. ඉපදුන විට ඇස් ඇරීමට නොහැක.
16. වේගයෙන් කෙටි දුර දුවයි.
17. නිද්‍රාව වැඩිය.
18. අලසය. බර ඇදීමට නොහැක.
19. දිව ගොරෝසුය
20. ආහාර ගැනීමේදී නොසන්සුන්ය.
21. හිලෑ කිරීම අපහසුය.
22. සමහර සතුන් තම දරුවන් මරණයට පත් කරයි.

**සියලු සත්වයෝ වචනයේ පරිසමාප්තියෙන්ම නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා. සුවපත් වෙත්වා.**

**නිර්මාංශාහාර සංගමයේ ලේකම්**
**ඩී.සී. පිරිස මහතාගේ ලිපියක් ඇසුරිනි.**

# සල්මලක් මත දුටු අනිත්‍යය

ශීල සමාධිය සුපිහිටි සිතෙකින්
විරිය මුල්වී තිර අදිටනෙ කින්
දානය පිළියෙල වී උදෑහැනෑ කින්
ඒ ගෙන ගිය මොහොතේ දී නිසැ කින්

මගදී මල් මල් සුවඳක් දැනුනා
වට පිට බැලුවිට සල් ගස දිලුණා
පිපිමල් රෑණක නෙත සිත බැඳුණා
මල් ටික වට්ටියකට රැස් කෙරුණා

මල් රැස පිදුවෙමි බුදුහිමි අබියස
සැදැහැ සිතින් පිරි සුවය නිරාමිස
විඳිමින් තණ්හා වේගයෙ සොමිරැස
ඉම්හිරි සුවයක ගැලුණා හදකුස

පුදසුන මත පරමල් නෙත ගැටුණා
සල් මල් වට්ටිය දැක සිත බිඳුණා
පෙති ගැලවී නිල් පැහැ ගෙන තිබුණා
මනහර සුවඳයි හැඩයයි මැරුණා

සල් මල් අරමුණ සිත තුළ රන්දා
පහළ වුනේ දුක් සිතුවිලි කන්දා
මුලදී ඇතිවුන සොම්නස කැන්දා
ගන්නට නොහැකිය පරමල් හින්දා

පිපුණු මල නිසා සුවයක් වින්දා
පරමල් දැක ඒ සුවමුල් සින්දා
සැප සිත දුකකට පෙරලුන හින්දා
හදුනම් සැපයක ඇති දුක රන්දා

නැතිවන හැමදේ දුකමය දෙන්නේ
ඇතිවූ හින්දයි නැතිවී යන්නේ
ඇතිවන සැප දියවී දුක දෙන්නේ
ඒකයි සැපයද දුකයි කියන්නේ

ශාන්තිනී තේජා කරුණාරත්න
සා.අංක 1047
(5 වන කණ්ඩායම)

# ඉරියාපථ භාවනාව තුළ විදර්ශනාව වඩමු

ඉරියාපථ භාවනාව තුළ විදර්ශනා වඩන්න නම් ඉරියාපථ භාවනාව තුළ සිහිය පිහිටුවල ඉරියව් පැවැත්ම කෙරෙහි හොඳ අවබෝධයක් ඇති කර ගෙන තියෙන්න ඕන. කායික ඉරියව් කෙරෙහි හොඳ සිහිය පිහිටුවා ගත්ත කෙනෙකුට තියෙනවා චේතනාව මුල්කර ගෙන මේ ශරීරය තුළ සෑම ඉරියව්වකම වෙනස්වීම සිදු වන ආකාරය හොඳින් තේරුම් ගන්න.

මේ කය සතර මහා ධාතුන්ගෙනුයි හටගෙන තියෙන්නෙ. ඒ කියන්නෙ පොළොවට පස් වෙලා යන ස්වභාවයට අයිති පඨවි ධාතුවෙන්, ජලයේ දියවෙලා යන ස්වභාවයට අයිති ආපෝ ධාතුවෙන්, උණුසුම් ස්වභාවයට අයිති තේජෝ ධාතුවෙන් හා වායෝ ධාතුවෙන්, තමයි මේ රූපය හැදිල තියෙන්නෙ. ඉරියාපථ භාවනාව තුළ දී අපි කායික ඉරියව්වල වෙනස්වීම දකිද්දි මේ සතර මහා ධාතුන්ගෙන් හටගත්තු ශරීරයේ ඉරියව් වෙනස්වීම තමයි අපි තේරුම් ගන්නේ. ඊළඟට මේ කායික ඉරියව්වල වෙනස්වීම ඔස්සේ විඳීම්වල වෙනස්වීම, කායික ඉරියව්වල වෙනස් වීම ඔස්සේ හඳුනා ගැනීම්වල වෙනස් වීම, කායික ඉරියව්වල වෙනස්වීම ඔස්සේ චේතනාවේ වෙනස්වීම මෙන් ම සිත් ඇතිවන වෙනස්කම් ද ඉරියාපථ භාවනාව තුළ හොඳින් සිහිය පිහිටුවා ගත් බුද්ධිමත් ශ්‍රාවකයාට තේරුම් ගන්න පුළුවන්කම තියෙනවා.

ඒ කියන්නේ කායික ඉරියව්වල වෙනස්වීම ඔස්සේ පංච උපාදානස්කන්ධය හට ගන්නා ආකාරයත්, වෙනස්වන ආකාරයත්, තේරුම් ගැනීම තුළ මේ ශරීරයේ ඉරියව් පැවැත්ම මුල්වෙලා ක්‍රියාත්මක වන හේතු ඵල පැවැත්ම මනා කොට තේරුම් ගන්න පුළුවන්කම තියෙනවා.

මේ ආකාරයට ඉරියාපථ භාවනාව තුළ පංච උපාදානස්කන්ධය බෙදා ගත්තු ආර්ය ශ්‍රාවකයාට පුළුවන්කම තියෙනවා ඉරියාපථ විදර්ශනාව වඩන්න. සතර මහා ධාතුන්ගෙන් හටගත්තු මේ කය සතර මහා ධාතුන් වෙනස්වීම නිසා අනිත්‍ය යි... අනිත්‍ය යි.... ඉරියව්වල වෙනස්වීම ඔස්සේ යම් විඳීමක් හට ගනීද ස්පර්ශය ප්‍රත්‍යයෙන් හටගත්ත එම විඳීම අනිත්‍ය යි..... අනිත්‍යයි... ඉරියව්වල වෙනස්වීම ඔස්සේ යම් හඳුනා ගැනීමක් හට ගැනීම ස්පර්ශය ප්‍රත්‍යයෙන් හට ගත්තු එම හඳුනා ගැනීම අනිත්‍යයි... අනිත්‍යයි... ඉරියව්ව වෙනස්වීම ඔස්සේ යම් චේතනාවක් හටගනී ද ස්පර්ශය නිසා හට ගත් චේතනාව අනිත්‍යයි... අනිත්‍ය යි... ඉරියව්වල වෙනස්වීම ඔස්සේ යම් සිතක් හට ගනී ද නාම රූප ප්‍රත්‍යයෙන් හට ගත් එම සිත අනිත්‍යයි... අනිත්‍යයි... ඉරියව්වල වෙනස්වීම ඔස්සේ හට ගන්නා මේ පංච උපාදානස්කන්ධය ම දුක යි... දුක යි... දුකයි... මම නොවේ... මගේ නොවේ... මගේ ආත්මය නොවේ... වශයෙන් මේ ශරීරයේ ඉරියව් පැවැත්ම මුල් වෙලා හට ගන්න පංච උපාදානස්කන්ධය විදර්ශනා කරන්න පුළුවන්. අන්න ඒක තමයි ඉරියාපථ විදර්ශනාව වෙන්නේ. හැබැයි ඉරියාපථ භාවනාව තුළ විදර්ශනාව වඩන්න පුළුවන් වෙන්නේ ඉරියව් පැවැත්ම කෙරෙහි හොඳින් සිහිය පිහිටුවා ගත්ත කෙනෙකුටයි.

**ඊළඟට ඉරියාපථ භාවනාව සම්බන්ධයෙන් ඉතා ම වැදගත් දෙයක් බුදුරජාණන් වහන්සේ අපට පෙන්වලා දීල තියෙනවා. අපේ හිතට යම් කිසි බියක්, තැති ගැනීමක් ඇතිවුණ වෙලාවට ඉරියාපථ භාවනාව මුල් කරගෙන ඒ ඒ ඉරියව් තුළ දී ම බිය දුරු කර ගන්නා ආකාරය මජ්ඣිම නිකායේ භය භෙරව සූත්‍රයේ පැහැදිලි කරල තියෙනවා.**

බුදුරජාණන් වහන්සේ වදාළා යම් ඉරියව්වක සිටින කොට බයක් තැති ගැනීමක් ඇති වන අරමුණක් පැමිණිවිට ඒ ඉරියව්ව තුළ ම භය නැතිකර ගැනීම දුරුකර ගන්න කියල. අපි හිතමු ඔබ සක්මන් කරගෙන යන කොට භයක්, තැති ගැනීමක් ඇතිවුණා. එතකොට ඉඳගන්නෙත් නැතුව නතර වෙන්නෙත් නැතුව නිදා ගන්නෙත් නැතුව සක්මන් කරන ඉරියව්ව තුළ දී ම සිතේ ඇති වෙච්ච ඒ බිය ජනක අරමුණ නුවණින් සලකළ දුරු කරන්න මහන්සි ගන්න ඕන.

අපි හිතමු කෙනෙක් නිදා ගන්න කොට භයක් තැති ගැනීමක් ඇති වෙනවා. එතකොට එයා නැගිටින්නෙත් නැතුව, ඉඳගන්නෙත් නැතුව සක්මන් කරන්නෙත් නැතුව නිදා ගන්න ඉරියව්ව තුළ දී ම ඒ බිය තැති ගැනීම දුරු කරගන්න මහන්සි ගන්න ඕන. අනෙක් සෑම ඉරියව්වකදීම මේ ආකාරයෙන් ම ඉරියව් වෙනස් නොකර බිය තැති ගැනීම දුරු කර ගන්න කියල බුදුරජාණන් වහන්සේ වදාළා.

**මේක අපට ඉතා ම වැදගත් දෙයක්. සාමාන්‍යයෙන් කෙනෙකුට බයක් තැති ගැනීමක් ඇති වුණොත් එයා තමන් ඉන්න ඉරියව්ව තුළ දී ඒක ප්‍රහාණය කරන්න මහන්සි ගන්නෙ නැහැ. එක්කො කෑගසාගෙන පැනල දුවනවා. එක්කො තමන් කරන්නෙ මොකක් ද කියල මතක නැහැ. එහෙම වුණාට පස්සෙ එයා ගෙ හිතේ බියජනක අරමුණ දුරු වෙන්නෙ නැහැ. බුදුරජාණන් වහන්සේ වදාළේ ඒ ඉරියව්ව තුළ දී ම අරමුණේ යථා ස්වභාවය හඳුනා ගෙන හිතින් දුරු කරන්න කියලයි. බියජනක අරමුණ හඳුන ගෙන ඒ අරමුණ විදර්ශනා කරද්දි අපේ හිතින් ඒක බැහැර වෙලා යනවා. ඉරියාපථ භාවනාව දියුණු කර ගත්ත කෙනෙකුට මේක ඉතා ම පහසුයි.**

**ආනාපානසති භාවනාව හැර අනෙක් භාවනා ක්‍රම, සතර ඉරියව් තුළ දී ම දියුණු කරන්නේ කෙසේද?**

ඇත්තෙන්ම ආනාපානසති භාවනාව හැර අනෙක් බොහෝ භාවනා ක්‍රම සතර ඉරියව් තුළ දී ම දියුණු කරන්න පුළුවන්කම තියෙනවා. අපි දන්නවා මෛත්‍රී භාවනාව ගැන කියැවෙන කරණීයමෙත්ත සූත්‍රයේදි බුදුරජාණන් වහන්සේ වදාළා

තිට්ඨං චරං නිසින්නෝවා
සයානෝ වායාව තස්ස විගතමිද්ධෝ
ඒතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු

හිටිගෙන ඉන්න කොට, ඇවිදගෙන යන කොට, ඉඳගෙන ඉන්න කොට, නිදාගෙන ඉන්න කොට කියන මේ සතර ඉරියව් තුළ දී ම මෛත්‍රී භාවනාව දියුණු කරන්න පුළුවන්ද කියල. අපි හිතමු ඔබ සියලු සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා. තරහ නැත්තෝ වෙත්වා, දුක් පීඩා නැත්තෝ වෙත්වා. සුව සේ ජීවත් වෙත්වා, ශාන්ත සුවයට පත් වෙත්ව කියල සිහි කරමින් සක්මන් කරනවා. ඊළඟට ඔබ නිදාගෙනත් නින්ද යනකල් මේ විදිහට මෛත්‍රී භාවනාව කරනවා. මේ හැම ඉරියව්වක් තුළ දී ම හිත තුළ මෛත්‍රී භාවනාව දියුණු වෙනවා.

අපි හිතමු ඔබ මේ ඇස අනිත්‍යයි. කණ අනිත්‍යයි. දිව අනිත්‍යයි. කය අනිත්‍යයි. මනස අනිත්‍යයි කියල අනිත්‍ය භාවනාව වඩන කෙනෙක් නම් ඔබට පුළුවන් ඒ අනිත්‍ය භාවනාව සක්මන් කරන ගමනුත් සිහි කරන්න. හිටගෙන ඉන්න ඉරියව්ව තුළත් සිහි කරන්න. නිදා ගෙන ඉන්න ඉරියව්ව තුළත් සිහි කරන්න. අපි හිතමු ඔබ අසුබ භාවනාව වඩන කෙනෙක් කියල. ඔබට පුළුවන් සතර ඉරියව්ව තුළ දී ම මේ කෙස් පිළිකුලයි. ලොම් පිළිකුලයි. නියපොතු පිළිකුලයි. මේ දත්, සම, මස්, නහරාදී මේ දෙතිස් කුණප කොටස් පිළිකුල් වශයෙන් නුවණින් සලකමින් භාවනාව වඩන්න.

මේ විදිහට බලන කොට අපට පැහැදිලිව පේනවා ගිහි ගෙදර ජීවත් වෙන කෙනෙකුට භාවනා කරන්න ඕන තරම් වෙලාව තියෙනවා කියල බොහෝ දෙනෙක් කියන්නෙ අපට භාවනා කරන්න වෙලාවක් නැහැ. අපට වැඩ තියෙනවා කියල. දැන් බලන්න ගමන් බිමන් යන කොට පුළුවන්කම තියෙනවා පංච නීවරණ හිතට එන්න ඉඩ නො දී භාවනා මනසිකාරයක් සිහි කරන්න. බස්එකේ යන කොට පුළුවන්කම තියෙනවා භාවනා මනසිකාරයක යෙදෙන්න. රාත්‍රී නින්දට යනකල් භාවනා මනසිකාරයක යෙදෙන්න පුළුවන්කම තියෙනවා. ඒ නිසා උවමනාවක් තියෙනවා නම් මේ සංසාරෙ භය දකින බුද්ධිමත් හැම කෙනෙකුට ම භාවනාව දියුණු කරල මේ ජීවිතයේදීම ධර්මය අවබෝධ කර ගන්න පුළුවන්කම තියෙනවා.

**ගලිගමුවේ ඤාණදීප හිමිගේ**
**ලිපියක් ඇසුරෙනි.**

විග්‍රහය

# සුනාමි ඛේදවාචකයේ ධර්මානුකූල පදනම

**විශ්වයේ ක්‍රියාකාරිත්වය සිදුවන්නේ පංච නියාම ධර්මයන් පූර්ව කොට ගෙනය. සජීවී ස්වභාව ධර්මය තුළ චිත්ත නියාමය හා කම්ම නියාමය දැඩිව ක්‍රියාත්මක වන අතර අජීවී ස්වභාව ධර්මය තුළ උතු නියාමය ධම්ම නියාමය හා බීජ නියාමය ක්‍රියාත්මක වේ. ස්වභාව ධර්මය යනු පංච නියාම ධර්මයන්ගේ හා සංසාරික පැවැත්ම යන දෙවතයේ සංකලනයකි. චක්කවත්ති සීහනාද සූත්‍රයේ සඳහන් වන පරිදි සමාජය අධාර්මික වන විට පරිසරය විවිධ අසමතුලිතතාවයන්ට භාජනය වී ඊට ප්‍රතිචාරීව ස්වභාව ධර්මයද වෙනස් වීම නිසා ස්වභාවික විපත්තීන් ඉතා දරුණු ලෙස පුද්ගල ජීවිතයට සමීප වෙයි.**



බුදු දහම තුළ ලෝකය හා සත්වයාගේ පැවැත්ම සම්බන්ධයෙන් මහා තිත්යාතන සූත්‍රයේ පූර්ණ විග්‍රහයක් දක්වේ. දීඝනිකායේ මහා පරිනිබ්බාන සූත්‍රයට අනුව මහ පොළව කම්පා වන ක්‍රම අට ලෙස විවිධ කාලගුණික වෙනස්වීම් මගින්, සෘද්ධිමතුන්ගේ බලපෑම් මගින්, ශ්‍රද්ධාවන්තයෙකු මෙලොවට බිහි වීම, බෝධි සත්වයෙකුගේ උත්පත්තිය, බුදුවීම, ප්‍රථම ධර්ම දේශනාව, අයු සංස්කරණය යන්න එම සිද්ධාන්ත වේ. කල්ප විනාශ වන ක්‍රම තුන ලෙස ගින්නෙන්, ජලයෙන් හා සුළඟින් වන බවත් මේවා උත්පාදනය වීමට හේතු භූත වන්නා වූ සාධක ලෙස පිළිවලින් ලෝභය, ද්වේශය හා මෝහය පූර්ව කර ගනිමින් සිදු කරන සියලු අකුසල ක්‍රියාවන් නිසා මරණයට පත්වීම සිදුවේ.

විශ්වයේ ක්‍රියාකාරිත්වය සිදුවන්නේ පංච නියාම ධර්මයන් පූර්ව කොට ගෙනය. සජීවී ස්වභාව ධර්මය තුළ චිත්ත නියාමය හා කම්ම නියාමය දැඩිව ක්‍රියාත්මක වන අතර අජීවී ස්වභාව ධර්මය තුළ උතු නියාමය ධම්ම නියාමය හා බීජ නියාමය ක්‍රියාත්මක වේ. ස්වභාව ධර්මය යනු පංච නියාම ධර්මයන්ගේ හා සංසාරික පැවැත්ම යන දෙවතයේ සංකලනයකි. චක්කවත්ති සීහනාද සූත්‍රයේ සඳහන් වන පරිදි සමාජය අධාර්මික වන විට පරිසරය විවිධ අසමතුලිතතාවයන්ට භාජනය වී ඊට ප්‍රතිචාරීව ස්වභාව ධර්මයද වෙනස් වීම නිසා ස්වභාවික විපත්තීන් ඉතා දරුණු ලෙස පුද්ගල ජීවිතයට සමීප වෙයි.

'2004' වර්ෂයේ දෙසැම්බර් 26 වන දින සිදුවුණු සුනාමි ඛේදවාචකය නිසා කුසල් අකුසල් කළ නොකළ දහස් සංඛ්‍යාත පිරිසක් සමුද්‍රය විසින් බිලි ගැණුනි. මරණයක් සිදු විය හැකි ආකාර හතරක් ලෙස ආයුක්ඛ, උභයක්ඛ, කම්මක්ඛය හා උපපච්චවේදක අනුව බෞද්ධ විග්‍රහයේ දක්වේ. එනම් කර්මය හා ආයුෂ ක්ෂය වීමෙන් පමණක් නොව සුළඟට පහනක් නිවී යාන්නාක් මෙන් හදිසි අනතුරු වලින්ද මරණය සිදුවිය හැක. ඒ අනුව සමහර පිරිස් මෙම ධර්මතාවයන්ට අනුව මිය පරලොව ගියද, සමහර පිරිස් කර්ම නියාමයට අනුව, දිට්ඨධම්මවේදනීය කර්මය, උපපච්චවේදකීය කර්මය, සහ අපරාපරියවේදනීය කර්මය අනුව මෙම පුද්ගල විපත් සිදුවන්නට ඇත. අධ්‍යාත්මික වශයෙන් ධර්මානුකූලව ජීවිතයක් ගත කළ අය පවා මරණයට පත් වූහ. මේ භවය තුළ කුසල් රැස් කරමින් ධර්මානුකූලව ජීවිතයක් ගත කළත්, පෙර භවයකදී කළ අකුසලයන් හේතු කොට ගෙන මරණයට පත්වන්නට ඇත. මුගලන් මහරහතන් වහන්සේගේ ප්‍රවෘත්තිය මීට කදිම නිදසුනක් සපයයි. උන්වහන්සේ මේ භවයේදී ප්‍රාණඝාතමය අකුසල් ක්‍රියාවන් නොකළද, පෙර භවයකදී මව පියා මැරීම වන ආනන්තරීය අකුසල ධර්මය හේතු කොට ගෙන එහි විපාකයක් වශයෙන් මේ භවයේදී සොරුන් විසින් උන්වහන්සේව ඝාතනය කරන ලදී.

පවුල් වශයෙන්, ගම් වශයෙන් මිය පරලොව ගිය අවස්ථාද, මෙහිදී දක්නට ලැබුණි. එඩ්ගා කේසි පවසන ආකාරයට සංයුක්ත කර්මයට අනුව සාමූහික වශයෙන් කළ අකුසල ක්‍රියාවන්ට සාමූහික වශයෙන් විපාක දෙන බව සඳහන් වේ. වෛද්‍යවරයෙකුගේ පුතෙක් වයස අවුරුදු හතේදී ඇස් අන්ධ වීමට හේතුව පිළිබඳව එඩ්ගාකේසි ස්වයං මෝහනයට පත්ව තොරතුරු විමසන ලදී. එහිදී සත්‍යාපනය වූයේ ඔහුගේ ඇස් අන්ධ වීමට හේතුව භවතුනක් ඈතට යන බවයි. මොහු පේරු රටේ ගෝත්‍රික නායකයෙක්ව සිටියදී ඔහුගේ රාජකාරිය වූයේ ගෝත්‍රික සටන් වලදී අල්ලා ගන්නා යුධ සිරකරුවන්ගේ ඇස් උල් ආයුධයකින් ඇන, තුවාල කිරීමයි. ඒ අනුව මේ භවයේදී ඔහුගේ ඇස් අන්ධ වී ඇති බව ප්‍රත්‍යක්ෂ විය.

මෙම විපතෙන් මිය පරලොව ගිය අයගේ ඊළඟ භවය කුමක් මත පදනම්වේද යන්න ඇතැමෙකුට කුතුහලය දනවන කරුණකි. 'සබ්බේ භායංති මච්චුනෝ' යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාලේ සියලු සත්වයින් භයෙන් මිය පරලොව යන බවයි. භය හා අවසාන චේතනාව යනු ද්විත්වයකි. කෙනෙක් මිය ගිය විට මනුෂ්‍යයාගේ චිත්ත පරම්පරාව චුති සිතින් අවසන් වන විටම අළුත් කර්මයක් නිසා අළුත් ප්‍රතිසංධි සිතක් උපදී. ඒ අනුව පුද්ගලයා රැස්කරන කුසල් අකුසල් මගින් ඔහුගේ ඊළඟ භවය සකස් කරයි. මිය ගිය කෙනා අඳුරට ගමන් කරනවාද, එළියට ගමන් කරනවාද යනුවෙන් පැවසිය හැක්කේ, ගරුක කර්මය, ආසන්න කර්මය, ආචින්න කර්මය හා කටත්තා කර්මය ආදී සිද්ධාන්තයන්ට පදනම්වය.

ලෞකික ජීවිතයට අවශ්‍ය දේ රැස්කර ගන්නවා මෙන්ම ඊට සමාන්තරව ලෝකෝත්තර ජීවිතයට අවශ්‍ය අධ්‍යාත්මික පසුබිමක් ගොඩ නගා ගත යුතු බව ස්වභාව ධර්මය විසින් එත්තු ගැන්වීමක් කළ බව මෙම සුනාමි ඛේදවාචකයෙන් තහවුරු වේ.

**ඉසුරි ඉන්දිකා හෙට්ටිආරච්චි**
**සා.අංකය 262**
**(පළමුවන කණ්ඩායම)**

# නිවේදන සහ නොමිළයේ පලකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

**වැදගත්**

❖ මෙත් සවිය පුවත් සඟරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපි ද, දාන-ශිල-භාවනා වැඩසටහන් වලදී දායකත්වය දරන පිංවතුන්ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන්ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිළයේ පලකරනු ලැබේ. කොළ කැබැලි හා කුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

❖ සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තිබිය යුතුය. ඔබගේ ලිපිනය ලියාදීම සඳහා භාවනා වැඩසටහන් වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවලද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන්කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබියාම පිළිබඳව වග කියනු නොලැබේ.

- සංස්කාරක -

## මෙත්සවිය දුරකථන අංක

**මෙත්සවිය තොරතුරු විමර්ශනය කරනවිට පරිපාලන නිලධාරී මහතා** අමතන්න (0714-014467). එම දුරකථනයේ බිල්පත් ගෙවනු ලබන්නේ මෙත්සවිය මෛත්‍රී සංසදය විසිනි.

**මීට අමතරව සමලේකම් වරුන් වන තුසිත දොඹගොඩ (0777-710765) හා බී. ඩබ්. චමින්ද (දු.ක. 0773-065807)** යන මහතුන් ගේ පුද්ගලික දුරකථන අංකයන් අමතා ද හදිසි තොරතුරු ලබා ගත හැකිය.

**සංසදයේ සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක (0714 800800 හෝ 0777 309385)** මගින් දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක් (ඉතා හදිසි අවශ්‍යතාවයකදී ඕනෑම වේලාවක) සිදුකරන්න. (දිනකට දුරකථන පණිවිඩ 30 ක් පමණ ලැබෙන නිසා සාමාජික අංකය හා නම පවසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම සිදුකරන්නේ නම් මැනවි.)

## හත්වන භාවනා වැඩසටහන

2005 සැප්තැම්බර් 11 වන දින සිට ඇරඹීමට නියමිත හත්වන භාවනා වැඩසටහන සඳහා 31.08.2005 දිනට පෙර සාමාජිකත්වය අළුත්කරගත් 1,2,3,4 කණ්ඩායම්වල සාමාජිකයිනට සහභාගි විය හැක. ඉඩකඩ සීමිත බැවින් සාමාජිකත්වය අළුත් කරගන්නා විට භාවනා වැඩසටහනට පැමිණෙන/නොපැමිණෙන බව 2005.08.31 දිනට පෙර කාර්යාලයට දන්වන්න. ඉතිරි ඉඩකඩ අනුව 2005.08.21 දිනට පෙර අයදුම් පත් එවූ අයගෙන් තොරා නව සමාජිකයින් බඳවා ගැනේ.

මනාව සැලසුම් කල සොඳුරු නිවසක් සඳහා
**Home Sweet Home Design**
161, කන්දවිහාර පාර, කළුවාමෝදර, අලුත්ගම.
034-2272040
මෙත් සවිය සමාජිකා එම්. ඒ. එල්. චන්ද්‍රලතා
වාස්තු විද්‍යා, තාක්ෂණවේදී
(Architectural Technologist)

**ප්‍රායෝගික අධිමානසික විද්‍යාව හා පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ හය වන වැඩ සටහන**
2005.09.11 ඉරු දින පෙ.ව. 10.30 ට අරඹනු ලබන වැඩසටහන සඳහා අයදුම්පත් 2005.08.31 දිනට පෙර භාරගනු ලැබේ.
(බඳවා ගැනෙනුයේ සීමිත සංඛ්‍යාවකි)

**ඔබේ මංගල සිහිවටනය විශේෂ අවස්ථා ඡායාරූපගත කර ගැනීමට**
විමසන්න: මෙත්සවිය සාමාජික
එස්. පී. පියරත්න
නො: 2/6/ඩී, ගම්පහ පාර
මිරිස්වත්ත
ටෙලි: 03322 26534

හොරණ තල්ගහවිල හංදිය ආසන්නයේ කුඩාඋඩුව ප්‍රධාන මාර්ගයට මායිම්ව ඇති "තක්ෂිලා සෙවණ" හි පර්චස් 12.73 ඉඩම ඉතා පහසු මිලට විකිණේ. කැබලි අංකය 88.
විමසීම් - උදය 0713090170
සාමාජික අංකය 537

• ග්‍රහස්ඵුට සහිත සඳහන් ගණනය කිරීම
• හඳහන් බැලීම
• සුභ නැකැත් සෑදීම
• යමකාල නැකැත්
• විවාහ පරීක්ෂාව
• වාස්තු විද්‍යාව
• නාමකරණය
• ශාන්ති කර්ම ඇතුළු සියලුම ගුප්ත විද්‍යා කටයුතු

දෛවඥසැලසුම් ශිල්පී පර්මාණ මිනුම් ශිල්පී,
මනෝ විද්‍යා, අධි මානසික විද්‍යා පුහුණු සහතික ලත්
හෙ. පද්මසිරි
ශ්‍රී ශෛලබිම්බාරාමය, ඇවරිවත්ත, කටුනායක
දුර: 077-7228416

**දඹදිව වන්දනා චාරිකා - 2006 පෙබරවාරි මස**
සම්බුදු පා පහස ලද බුද්ධගයාව, බරණැස, කුසිනාරා, රජගහ, ලුම්බිණිය, සැවැත්නුවර, සාංචිය ආදී පූජනීය ස්ථාන සිය ගණනක් වැඳපුදා ගැනීමට ඔබටත් ආරාධනා.........., දින 22 යි.
සිද්ධස්ථාන වලට ගෙවීමත් ඇතුළුව අය කිරීම රු.48000 ක් පමණි. සුව පහසු නවාතැන්, ලංකාවේ ක්‍රමයට ආහාර පාන.
විමසන්න.
මෙත් සවිය සාමාජිකා,
චන්ද්‍රා ජයකොඩි, 'තුෂාරි'
බටපොත,මාදෙල්ගමුව, ගම්පහ.
දු.ක. 033-2230592
033-2230593
සාමාජික අංකය 6-1107

## මෙත් සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය - සාමාජික අයදුම්පත

(ඡායා පිටපත්ද භාර ගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන්ම රහසිගතව තබා ගනු ලැබේ.)

1. සම්පූර්ණ නම ......................................................

2. ස්ත්‍රී / පුරුෂ භාවය ........................ 3. ජාතික හැඳුනුම්පත් අංකය. ........................ (ඡායා පිටපතක් අමුණන්න)

4. උපන් දිනය ........................ 5. වයස ................ 6. ආගම ........................

7. ස්ථිර ලිපිනය ......................................................

........................විද්‍යුත් තැපැල් (e-mail) ........................ දුරකථන අංකය ........................

8. දිස්ත්‍රික්කය ........................ 9. විවාහක / අවිවාහක බව ........................

10. රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර: ........................

......................................................

11. කාර්යාලීය ලිපිනය හා දුරකථන අංකය: ........................

12. ලිපි එවිය යුතු ලිපිනය: ........................

13. ලබා ඇති ඉහළම අධ්‍යාපනික සුදුසුකම්
 1. ........................
 2. ........................

14. වෙනත් සංගම් ආදියෙහි තනතුරු හෝ සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර
 1. ........................
 2. ........................
 3. ........................

15. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇඳුම, හෘද රෝග, දියවැඩියාව, රුධිර පීඩනය, අපස්මාරය) පෙළෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර ........................

16. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද? ඔව්/නැත.

17. එවැනි මානසික රෝගයකින් පෙළෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර ........................

18. ඔබ විසින් සඳහන් කළයුතු මෙහිදී වැගත්යැයි හැඟෙන වෙනත් විස්තර හෝ යෝජනා/අදහස් තිබේනම් මෙහි සඳහන් කරන්න. ........................

......................................................

මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.

දිනය ........................ අයදුම්කරුගේ අත්සන ........................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

සාමාජික අංකය ........................

තේරීම් කමිටුවේ තීරණය

........................

තේරීම් කමිටු සභාපති

........................

විධායක ලේකම්

දිනය ........................



**සැ.යු. මෙම අයදුම් පත සමගම ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශන/වැඩමුළු/මනස දියුණු කිරීමේ වැඩ සටහන් සංවිධානය කිරීම, දේශන ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ගාස්තු, පුවත්පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම, ඡායාරූපය සහිත ප්ලාස්ටික් හැඳුනුම්පත් සැපයීම, තැපැල් ගාස්තු, විදුලිය ගාස්තු, කාර්යාල ගාස්තු හා පරිපාලන නිලධාරි මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනීම සඳහා රු. 1000/=ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය. (ඒ ඇතුළත්වීමේ ගැස්තුව රු. 500/= හා වාර්ෂික සාමාජික මුදල රු.500/=වශයෙනි.) මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායමක් ලබන පවුල්වල අය තම ආදායම තහවුරුකළ හැකි ලිපි ලේඛන සහිතව ග්‍රාම නිලධාරීතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තුව ඉවත්කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාට පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ). කාර්යාලය සෙනසුරාදා, ඉරිදා ද ඇතුලුව සතියේ දින 5 ක් විවෘතව පවතී. අයදුම් කරන සැම කෙනෙකුම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍ය නම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත් වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය.**

*නිසිපරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ 4"x 9" ප්‍රමාණයේ ලිපිනය ඇති මුද්දර කවර දෙකක් සමඟ පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් යොමුකරන්න.*

*(අයදුම් පත සමඟ කිසිදුමුදලක් හෝ චෙක්පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ.)*

*ලිපිනය:- ගරු ලේකම්, මෙත් සවිය ප්‍රධාන කාර්යාලය , ශ්‍රී විජයාරාමය, පෙඩ්රිකා පාර, කොළඹ 06. දුරකථන 0714-014467*

# පිං පොතෙන් බිඳක්....





2005.05.15 දින රහතුන් වැඩ සිටි ගල්ලෙන් සහිත ඇඹලෑව හෙවත් වර්තමාන ඇඹුල්ගම රජමහා විහාරස්ථානයේ පැවැත්වූ දාන-සිල-භාවනා වැඩ සටහනේ අවස්ථා කිපයක්. පුරුෂ ධර්මසාරථි මුද්‍රාවෙන් යුත් ලක් දිව උසම බුදුපිළිමය පසකින් දැක්වේ.



පූජාමියෙන් විපතට පත් අළුත්ගම තලවත්ත ධර්ම දීප යෝගශ්‍රමය වෙත මහජන ඇමතුම් උපකරන කට්ටලයක් මෙත් සවිය මඟින් ප්‍රධානය කරන අවස්ථාව.




ඇඹුල්ගම රජමහා විහාරස්ථානයේ අප විසින් පැවැත්වූ ප්‍රථම දාන-සිල-භාවනා වැඩසටහනට සහභාගි වූ 1 වන කණ්ඩායමේ සමාජිකයින්ගේ ධන පරිත්‍යාගයෙන් තනන ලද සක්මන් මළුව.





මෙත් බෝසතාණන් වහන්සේගේ පිළිරුව තැනීම සඳහා මියගිය ස්වාමියාට පිං පිණිස සංසදයේ සමාජිකා පුජාතා දිසානායක මහත්මිය විසින් රු. 50,000.00 මුදලක් ධර්ම ගවේෂී බෞද්ධ ආශ්‍රමයේ විහාරාධිපති පඤ්චේන්ද්‍රිය ස්වාමිදුයන් වහන්සේ වෙත පූජා කරන අවස්ථාව.




2005.05.08 දින 6 වන භාවනා වැඩසටහන ආරම්භ වන අවස්ථාවේදී පිටකොටුව පදික වේදිකාවේ සිටින අසරණ අබාධිත වැඩිහිටියකු වන එල්. ඒ. රූපචන්ද්‍ර මහතා වෙත රෝද පුටුවක් සහ ලොතරැයි විකිණීම ඇරඹීම සඳහා රු. 5000.00 මුදලක් පරිත්‍යාග කරන අවස්ථාව.



2005.05.01 දින නවගමුව පත්තිනි දේවාලය අසල හිඟමනෙහි යෙදෙන අබාධිත පුද්ගලයකු වන අංගොඩ පුෂ්පකුමාර මහතා වෙත මෙත්සවිය මඟින් රෝද පුටුවක් පරිත්‍යාග කරන අවස්ථාව.

2005.05.15 දින ඇඹලෑව හෙවත් වර්තමාන ඇඹුල්ගම රජමහා විහාරස්ථානයේ පැවැත්වූ දාන-සිල-භාවනා වැඩ සටහනට සහභාගී වූපිරිසෙන් කොටසක් සහ එම ස්ථානයේ ජල සැපයුම සඳහා සමාජිකයින් විසින් රැස්කල රු. 45,000.00 මුදල විහාරාධිපති ස්වාමිද්‍රයන් වහන්සේට භාර දුන් අවස්ථාව.




2005.06.05 දින මාසයේ ප්‍රථම ඉරු දින වැඩසටහනේදී ගරු හාරිස්පත්තුවේ අරියවංශාලංකාර ස්වාමින්ද්‍රයන් වහන්සේගේ සුමධුර ධර්ම දේශනාවට සවන්දෙන දහසකට අධික මෙත් සවිය සමාජිකයින් පිරිස.




2005.05.08 දින ආරම්භ වූ 6 වන භාවනා සහ චිත්ත සංයම අභ්‍යාස වැඩසටහනට සහාභාගි වන මෙත්සවිය 6 වන කණ්ඩායමේ පිරිස ආචාර්ය චන්දන ජයරත්නයන්ගේ උපදෙස් පරිදි කසින භාවනාව පිළිබඳ දැනුවත් වන අන්දම.




2005.05.23 වෙසක් පොහෝ දින මතු මෛත්‍රී බෝසතානන් වන නාථ දෙවියන්ගේ පිළිමයක් කොළඹ -07 ධර්ම ගවේෂි බෞද්ධ ආශ්‍රමයේදී විවෘත්ත කරන ලදී.
මේ සඳහා අප සංසදය විසින් සහ සමාජිකයින් විසින් රු. 85,000.00 මුදලක් පරිත්‍යාග කරන ඇත.



අප සංසදයේ සාමාජික සරත් ඉලංගන්තිලක මහතා විසින් තම පුද්ගලික ධන පරිත්‍යාගයෙන් රහතුන් වැඩ සිටි ඇඹුල්ගම රජ මහා විහාරස්ථානයේ තනා නිමකළ ප්‍රථම භාවනා අවාස කුටිය.

මුද්‍රණය ආර්. පී.ග්‍රැෆික්ස්, බොරලැස්ගමුව. 5554300

සැකසුම - ආචාර්ය චන්දන ජයරත්න